පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 492

ආයතනයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வினா இலக்கம் 492

நிறுவனத்தின் பெயர் : தேசிய கல்வி ஆணைக்குழு

பாராளுமன்றத்தில் அரச கணக்குகள் தொடர்பான செயற்குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரது அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் குறித்த விபரங்களை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 492

Name of the institution : National Education Commission

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)

පාර්ලිමේන්තු සැසිවාර අංකය : 492

ආයතනයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස : 81.00	
1. අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යාමට නොහැකි වී ඇත්තේ පහත සඳහන් කරුණු හේතුවෙනි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) මඟින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක (Internal Auditor) තනතුරක් ඇතුළත් වී නොමැත. එබැවින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් කොමිෂන් සභාවේ විගණන කටයුතු සිදුකරවා ගැනීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර කොමිසමේ අනුමැතිය සහිතව ඉදිරිපත් කරන ලදි. වත්මන් ප්‍රගතිය: එම අනුමත සැලැස්මට අනුව අවශ්‍ය විගණන කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා, කොමිෂන් සභාව විසින් 2025.06.24 දිනැති සහ NEC/CH/128 දරන ලිපිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිල වශයෙන් ඉල්ලීමක් යොමුකර ඇත.
2 අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛනය ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වාගත යුතු ලේඛනයකි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) මඟින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක (Internal Auditor) තනතුරක් ඇතුළත් වී නොමැති බැවින් අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගැනීමට නොහැකි වී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරදීමට 2026.04.09 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවති විගණන හා

		කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණය කර ඇත.
3	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	නියමිත ආකෘතිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
4	මු. රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	අංක 01 පිළිතුර අදාළ වේ.
5	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 වසර තුළ විගණන හා කළමනාකරණ කමිටු දෙකක් (02) 2023.03.17 දින සහ 2023.12.20 දිනවල පවත්වා ඇත. වර්තමානයේ, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.
6	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මේ වන විට භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු රජයේ ආදායම් ගිණුමට පවරා දීමට කටයුතු කරමින් පවතී.
7	වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකාර පනතේ 61 (3) උප වගන්තියට අනුව සියලු රජයට අයත් ව්‍යවසායයන් විසින් ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තාව, අප ආයතනයට අදාළව නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.
	දෙවැනි කොටස : 52.00	
8	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	ආයතනයේ විෂය පථයට අදාළව අනුගත කරගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු හා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ.
9	2018.01.24 දිනැති අංක 05/2008(I) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ	ආයතනය සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

	චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
10	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කිරීමට කටයුතු කරමින් පවතී.
11	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	අවශ්‍ය පරිදි හඳුනාගෙන, ඉදිරි වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

මහාචාර්ය ඒ. සරත් ආනන්ද
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
පළමු මහල, ගොඩනැගිලි අංක 5,
බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.